85308

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම : ....................................................................................... විභාග අංකය : ..................................................

## I කොටස

සැලකිය යුතුයි :
- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටසේ 01 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලේ ම නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

(01) පැරණි සමාජයේ ජනතාවට මුහුණ දීමට සිදු වූ ප්‍රධාන අභියෝගයක් වූයේ,
  (1) සතුරන්ගෙන් රට ආරක්ෂා කර ගැනීමයි.
  (2) යැපීම සඳහා ආහාර නිෂ්පාදනය කර ගැනීමයි.
  (3) භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමයි.
  (4) වගා බිම් සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමයි.

(02) අතීතයේ ජනතාව උඳු පරිභෝජනය කළ බවට තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍රය කුමක් ද?
  (1) සීහළවත්ථු ග්‍රන්ථය.  (2) ජාතකට්ඨ කථාව.
  (3) මහාවංසය.  (4) ඉරිපින්නියාව සෙල්ලිපිය.

(03) මහසෙන් රජු මින්නේරි දෙවියන් සේ සලකන ලද්දේ,
  (1) දේවාල ඉදිකර හින්දු ආගමට අනුග්‍රහය දැක් වූ නිසා ය.
  (2) රට සතුරන්ගෙන් බේරා ගත් නිසා ය.
  (3) වෙහෙර විහාර හදමින් බුදුදහමට සේවය කළ නිසා ය.
  (4) කෘෂිකාර්මික සංවර්ධනය සඳහා කළ සේවය නිසා ය.

(04) හතර වන උදය රජුගේ සොරබොර වැව සෙල් ලිපියේ සඳහන් වන්නේ,
  (1) වෙළඳාම පිළිබඳ නීති ය.
  (2) අපරාධ පිළිබඳ නීති ය.
  (3) පරිසරය පිළිබඳ නීති ය.
  (4) වැවේ ජලය භාවිතා කිරීම පිළිබඳ නීති ය.

(05) අතීතයේ දී විවාහ මංගල්‍ය උත්සව සිදු වූයේ,
  (1) විලාසිතාවන්ට මුල් තැන දෙමිනි.
  (2) ප්‍රභූ ජනතාව අතර පමණි.
  (3) අර්ථවත්ව හා ගෞරවාන්විතවය.
  (4) විසිතුරු අලංකාර සැරසිලිවලට මුල් තැන දෙමිනි.

(06) මානවම්ම රජ පෙළපත බලයට පත්වීමට පෙර මෙරට දේශපාලනයේ පැවති කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ,

(1) මධ්‍ය පාලනය ඉතා බලවත් වීම ය.

(2) අභ්‍යන්තර ගැටුම් හා රටේ ස්ථාවර පාලනයක් නොතිබීම ය.

(3) එක් රජ පෙළපතක් පමණක් පාලනය කිරීම ය.

(4) දකුණු ඉන්දියාවට අවශ්‍ය පරිදි පාලනය සිදුවීම ය.

(07)
- පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණයට හමුදාවක් යැවීම.
- ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජු මරණයට පත් කිරීම.
- දෙවන වරගුණවර්මන් රජුට යුධ ආධාර ලබාදීම.

ඉහත තොරතුරු හා සම්බන්ධ රජුගේ නම කුමක් ද?

(1) පළමුවන සේන (2) ඉළනාග

(3) මහානාග (4) දෙවන සේන

(08) අතීතයේ අන්තානි කණු වශයෙන් හඳුන්වා ඇත්තේ,

(1) මාර්ගවල දුර ප්‍රමාණය පෙන්වන කණු ය.

(2) රාජ්‍ය සීමා පෙන්වන මායිම් කණු ය.

(3) රාජකීය දීමනා සඳහන් ශිලා ලිපි ය.

(4) මූල්‍ය කළමනාකරණය පිළිබඳ සඳහන් ලේඛනය.

(09) දසගම් පාලනය හා අපරාධ නඩු විසඳීම පිළිබඳ නීති ඇතුළත් සෙල්ලිපිය මින් කුමක් ද?

(1) වේවැල්කැටිය (2) සිතුල්පව්ව

(3) දෙවනගල (4) කොණ්ඩවට්ටවාන්

(10) ශ්‍රී ලංකාවට ඉතා ම ආසන්නව පිහිටි දකුණු ඉන්දියානු රාජ්‍ය වූයේ,

(1) කාලිංග දේශයයි. (2) කේරළ දේශයයි.

(3) පල්ලව දේශයයි. (4) පාණ්ඩ්‍ය දේශයයි.

(11) පැරණි මොහෙන්ජොදාරෝ නරගය පිහිටි රට වන්නේ,

(1) ඉන්දියාව යි. (2) චීනය යි.

(3) පාකිස්ථානය යි. (4) නේපාලය යි.

(12) සීගිරියේ ජල තාක්ෂණික නිපුණතාවය පෙන්වන අතිවිශිෂ්ට නිර්මාණය කුමක් ද?

(1) ජල ටැංකි (2) ජල මල්

(3) පොකුණු (4) දිය අගල්

(13) වෙස් මුහුණු කලාව පිළිබඳ ප්‍රසිද්ධියට පත් නගර දෙක සඳහන් පිළිතුර තෝරන්න.

(1) පිළිමතලාව හා එළුගොඩ (2) දුම්බර හා අම්බලන්ගොඩ

(3) උඩුපිල හා මාතලේ (4) අම්බලන්ගොඩ හා උඩුපිල

(14) යුනෙස්කෝ සංවිධානය විසින් හඳුන්වා දී ඇති අස්පෘශ්‍ය උරුමවලට අයත් වන්නේ මින් කුමක් ද?

(1) වැව්, ගෘහ නිර්මාණ, චිත්‍ර

(2) රංග කලාව, ජන කවි, ජන සංගීතය

(3) කැටයම් කලාව, ප්‍රතිමා කලාව, ගෘහ නිර්මාණ

(4) චෛත්‍යය, බෝධිඝර, ප්‍රතිමාඝර

(15) කාලිංග මාඝ ලංකාවට පැමිණෙන විට පොළොන්නරුවේ සිටි පාලකයා වූයේ,

(1) වික්‍රම පණ්ඩු ය. (2) විජයබාහු ය.

(3) පරාක්‍රම පාණ්ඩ්‍ය ය. (4) නිශ්ශංකමල්ල ය.

(16) පොළොන්නරුවෙන් පසු බිහි වූ පාලන මධ්‍යස්ථාන වැඩි ප්‍රමාණයක් අයත් වන්නේ කුමන පාලන ප්‍රදේශයකට ද?

(1) රජ රටට (2) රුහුණු රටට

(3) මලය රටට (4) මායා රටට

(17) බෙලිගල කඳු මුදුනේ දළඳා වහන්සේ තැන්පත් කරන ලද්දේ කුමන රජු ද?

(1) තුන්වන විජයබාහු (2) දෙවන පරාක්‍රමබාහු

(3) තුන්වන පරාක්‍රමබාහු (4) හයවන විජයබාහු

(18)
- පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම.
- සිංහල බෝධිවංසය, අනාගත වංසය වැනි පොත් රචනා කිරීම.
- දෙවන බුවනෙකබාහු එහි ප්‍රථම පාලකයා වීම.

ඉහත කාර්යයන් සිදු වූයේ කුමන රාජධානි සමයේ ද?

(1) දඹදෙණිය (2) කුරුණෑගල

(3) ගම්පොළ (4) යාපහුව

(19) ගම්පොළ රාජධානියේ අවසාන කාලයේ ආක්‍රමණයක් එල්ල වූයේ කුමන රටින් ද?

(1) චීනය (2) පාණ්ඩ්‍යය දේශය

(3) ආරාබිය (4) කේරළය

(20) රෝම ඉතිහාසයේ ස්වර්ණමය යුගය සේ සැලකෙන්නේ කවර රාජ්‍ය කාලය ද?

(1) ජුලියස් සීසර්ගේ රාජ්‍ය කාලය (2) තියඩොසියස්ගේ රාජ්‍ය කාලය

(3) කොන්ස්ටන්ටයින්ගේ රාජ්‍ය කාලය (4) ඔගස්ටස් සීසර්ගේ රාජ්‍ය කාලය

ලකුණු $2 \times 20 = 40$

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

(01) (i) පහත A, B, C යටතේ දක්වා ඇති පින්තූර සම්බන්ධව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉර මත ලියන්න.

**A**



1. A පින්තූරයෙන් දක්වෙන්නේ කුමක් ද?

   .................................................................. (ලකුණු 02)

2. එම ගොඩනැගිල්ල කරවන ලද්දේ කුමන රජු ද?

   .................................................................. (ලකුණු 02)

**B**



1. B පින්තූරයෙන් දක්වෙන ගොඩනැගිල්ල නම් කරන්න.

   .................................................................. (ලකුණු 02)

2. එය අයත් වන්නේ කුමන රාජධානි සමයකට ද?

   .................................................................. (ලකුණු 02)

**C**



1. C පින්තූරයෙන් දක්වෙන පුද්ගලයා නම් කරන්න.

   .................................................................. (ලකුණු 02)

2. ඔහු අයත් වන්නේ කුමන රටකට ද?

   .................................................................. (ලකුණු 02)




85309

(ii) මෙහි දක්වා ඇති සිතියමෙහි A, B, C, D වශයෙන් පෙන්වා ඇති නගරවල නම් තිත් ඉරි මත ලියන්න.

A - ......................................

B - ......................................

C - ......................................

D - ...................................... (ලකුණු 4)

(02) (i) තෝනිගල සෙල්ලිපියේ සඳහන් වී වගාව කළ කන්න දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) වී ගොවි බිම් ආරක්ෂා කර ගැනීම සඳහා පැරැන්නන් අනුගමනය කළ සම්ප්‍රදායික ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) වී වගාව සඳහා කුඹුරක් සකස් කිරීමේදී පැරණි ගොවීන් අනුගමනය කළ ක්‍රමවේදය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(03) (i) අතීතයේ රාජ්‍ය පාලන කටයුතුවලට සහාය දුන් නිලධාරීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 2)

(ii) නීතිය හා සාමය පවත්වාගෙන යාම සඳහා අනුරාධපුර යුගයේ දී පැවති නීති වර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) මහා පරාක්‍රමබාහු රජුගේ සේවාවන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(04) (i) රජරට ශිෂ්ටාචාර සමයේ පැවති ආගමික නොවන උත්සව දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) පහත දක්වා ඇති තොරතුරුවලට අදාළ පිළිතුර A, B, C, D ලෙස අනුපිළිවෙලින් ලියන්න.

A. I විජයබාහු රජුගේ උසස් ගුණාංග සඳහන් සෙල්ලිපිය -

B. I පරාක්‍රමබාහු රජුගේ උපන් ස්ථානයේ ඉදි කළ චෛත්‍යය -

C. නිශ්ශංකමල්ල රජුගේ රාජවංසය -

D. යාපනයේ රජ පරම්පරාව හඳුන්වන නම - (ලකුණු 4)

(iii) අපේ සංස්කෘතික උරුම රැකගැනීමේ වැදගත්කම පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)

(05) (i) නිශ්ශංකමල්ල රජු ඉදි කළ ආගමික ගොඩනැගිලි දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) නිශ්ශංකමල්ල රජු මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) ජනතා ප්‍රසාදය ලබා ගැනීම සඳහා නිශ්ශංකමල්ල රජු ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 5)

(06) (i) ගම්පොළ රජ සමයේ රජුට අමතරව බලවත්ව සිටි පුද්ගලයින් දෙදෙනා නම් කරන්න. (ලකුණු 2)

(ii) පොළොන්නරුවෙන් පසු ආරක්ෂිත ස්ථානවල පිහිටුවාගත් පාලන මධ්‍යස්ථාන දෙකක් සඳහන් කර ඒවායේ පාලකයින්ගේ නම් ලියන්න. (ලකුණු 4)

(iii) කෝට්ටේ යුගයේ පැවති අධ්‍යාපන හා සාහිත්‍යය දියුණුව පිළිබඳ වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 5)

(07) (i) රෝම සමාජයේ පැවති ජන කොටස් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) පහත අසා ඇති තොරතුරුවලට අදාළ පිළිතුර A, B, C, D ලෙස අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A. ජේසු උපත සිදු වන විට රෝමයේ සිටි පාලකයා -

B. ඊනිඩ් පද්‍ය ග්‍රන්ථයේ කතුවරයා -

C. ග්‍රීසියේ ප්‍රධාන දෙවඟන -

D. ග්‍රීසියෙන් ලොවට උරුම කළ පාලන ක්‍රමය - (ලකුණු 4)

(iii) රෝම පෞර රාජ්‍යවල පාලනය පිළිබඳ වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 5)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Answer

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 07 | විෂයය / பாடம் / Subject ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper I ,II | පිළිතුරු පත්‍රය |

## I කොටස

| | | | |
|---|---|---|---|
| (01) - 2 | (06) - 2 | (11) - 3 | (16) - 4 |
| (02) - 3 | (07) - 4 | (12) - 2 | (17) - 1 |
| (03) - 4 | (08) - 3 | (13) - 4 | (18) - 2 |
| (04) - 1 | (09) - 1 | (14) - 2 | (19) - 1 |
| (05) - 3 | (10) - 4 | (15) - 3 | (20) - 4 |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

(01) (i) A. 1. පරාක්‍රමබාහු මාළිගය 2. මහා පරාක්‍රමබාහු රජු (ලකුණු 4)

B. 1. ලංකාතිලක විහාරය 2. ගම්පොළ (ලකුණු 4)

C. 1. ඔගස්ටස් සීසර් 2. රෝමයට (ලකුණු 4)

(ii) A. මහනුවර B. පොළොන්නරුව

C. කෝට්ටේ D. යාපනය (ලකුණු 4)

(02) (i) පිටදඬෙහස, මදෙහස, අකලහස (ලකුණු 2)

(ii) * කුඹුරේ තැන තැන පොල්පිති හිටවීම.
* තෙල් පොගවන ලද පහන් තිර පත්තු කිරීම.
* මී තෙල් කොහොඹ තෙල් තවරන රෙදි කැබලි කදුරු කෝටුවල බැදීම. (ලකුණු 4)

(iii) * මීගවයන් යොදා පස බුරුල් කර ගැනීම.
* ජලය රැඳවීමට බිම සකස් කිරීම.
* නියර සකස් කර ගැනීම.
* වී වැපිරීම. (ලකුණු 5)

(03) (i) යුවරජු, සේනාපති, භාණ්ඩාගාරික
මහාලේඛක, අශ අදෙක, අති අදික (ලකුණු 2)

(ii) * ඉඩම් භුක්තිය පිළිබඳ නීති
* වෙළඳාම පිළිබඳ නීති
* කෘෂිකාර්මික බදු පිළිබඳ නීති
* අපරාධ නීති (ලකුණු 4)

(iii) * වැව් රාශියක් ඉදි කිරීම.
* දුදුරු ඔයේ අමුණු ඉදි කිරීම.
* පස්දුන් රට සංවර්ධනය කිරීම.
* වෙහෙර විහාර ඉදිකිරීම. (ලකුණු 5)

Answer

(04) (i) වප් මගුල් උත්සවය
ජල ක්‍රීඩා උත්සවය (ලකුණු 2)

(ii) A - අඹගමුව B - සුතිඝර චෛත්‍යය
C - කාලිංග D - ආර්ය චක්‍රවර්ති (ලකුණු 4)

(iii) * අපේ අතීතය විදහා පෑම.
* අපේ අනාගත පරපුරට ආරක්ෂා කළ යුතු වීම.
* දේශීය අභිමානය ඉස්මතු වීම.
* පැරැන්නන්ගේ දක්ෂතාවන් ඉස්මතු වීම. (ලකුණු 5)

(05) (i) හැටදාගෙය, රන්කොත් වෙහෙර, නිශ්ශංකලතා මණ්ඩපය, අටදාගෙය (ලකුණු 2)

(ii) * පරාක්‍රමබාහු රජුගේ සෙන්පතියන් අවනත කර ගැනීම.
* පාණ්ඩ්‍ය වංශිකයන් බලවත්වීම වළක්වා ගැනීම.
* රුහුණේ තම බලය පවත්වා ගැනීම. (ලකුණු 4)

(iii) * තුලාභාර දානදීම
* ජනතාව සමග රට පුර සංචාරය කිරීම.
* රට වැසියාගේ සුභ සාධන කටයුතු සිදු කිරීම.
* දිළින්දන්ට සැලකීම.
* සොර සතුරු බිය නැති කිරීම. (ලකුණු 5)

(06) (i) * සේනාධිලංකාර සෙනෙවිරත්
* නිශ්ශංක අලකේශ්වර (ලකුණු 2)

(ii) දඹදෙණිය - විජයබාහු
ගංදෙණිය පර්වතය - සංඛ සෙනෙවි
ගෝවින්දමලය - බුවනෛකබාහු ආදිපාද
යාපහුව - සුභ සෙන්පති (ලකුණු 4)

(iii) * අධ්‍යාපන ආයතන තිබීම.
* පඬිවරු විසීම.
* පොත්පත් ලියවීම.
* රජුගේ අනුග්‍රහය ලබා දීම.
මේවා ආවරණය වන පරිදි වාක්‍ය 5ක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

(07) (i) ප්‍රභූන්, සාමාන්‍ය ජනතාව, වහලුන් (ලකුණු 2)

(ii) A - ඔගස්ටස් සීසර් B - වර්ජිල්
C - ඇතීනා D - ප්‍රජාතන්ත්‍රවාදය (ලකුණු 4)

(iii) * ගෝත්‍ර පාලනය මුල් කාලයේ පැවතීම.
* පසුව රාජාණ්ඩු ක්‍රමයක් ඇති වීම.
* පසුව සමූහාණ්ඩු පාලනය
* කොන්සල්වරු දෙදෙනා
* රෝමය අධිරාජ්‍යයක් බවට පත් වීම.
මේවා ආවරණය වන පරිදි වාක්‍ය 5ක් තිබිය යුතු යි. (ලකුණු 5)